**INSTITUTE FOR HEALTH POLICY**

**72**, පාර්ක් වීදිය, කොළඹ-**2**, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 පෙබරවාරි 23
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 12:01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya


# ජා.ජ.බ/ජ.වි.පෙ සහ ස.ජ.බ ඡන්දදායකයින් අතර කරට කර සටනක්

*2023 ජනවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු.*

2023 ජනවාරි මාසයේ නවතම ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයේ (SLOTS) ඡන්දමතය විමසීමට අදාළව, මහ මැතිවරණයකදී ජා.ජ.බ/ජ.වි.පෙ සහ ස.ජ.බ සඳහා ඡන්දදායකයින් තම මනාපය ප්‍රකාශ කිරීමේ ප්‍රවණතාවය පිළිවෙළින් 32% සහ 31% බැගින් වන අතර දැනට ඔවුන් ආසන්නව සම තත්වයකින් ඉදිරියෙන් සිටියි. ජා.ජ.බ/ජ.වි.පෙ සඳහා දෙසැම්බර් සහ ජනවාරි මාස තුළ දී සිදු වූ නැග්මත් සමඟ මෙම සමාන මට්ටමට ලඟා වී තිබේ. දෙපාර්ශවයන්ම ශ්‍රී.ල.පො.පෙ, එ.ජා.ප සහ ශ්‍රී.ල.නි.ප යන පක්ෂයන්ට වඩා ඉදිරියෙන් සිටින නමුත් දෙපිරිස අතර වෙනස දෝෂ ආන්තිකය තුළ පවතියි.



IHP MRP විශ්ලේෂණයෙන් පෙනී යන්නේ 2022 ජූලි මාසයේ සිට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා බලයට පත්වීමෙන් පසුව ස.ජ.බ සඳහා ශුද්ධ ලකුණු තුනක් ද ජා.ජ.බ/ජ.වි.පෙ සඳහා එක ලකුණක් ද එ.ජා.ප සඳහා ලකුණු පහක් ද ලබාගෙන ඇති බවයි. මෙම ජයග්‍රහණය සඳහා බොහෝ දුරට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට තිබූ සහයෝගය ලකුණු 11 කින් පහත වැටීම වේ.





මහ මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රවණතාවය, මාර්තු මාසයේ පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට සමාන වේ යැයි උපකල්පනය කළහොත්, SLOTS ජනවාරි මත විමසීම තුළින් පෙන්නුම් කරන්නේ වර්තමාන ප්‍රවණතාවයන්ට අනුව ස.ජ.බ සහ ජා.ජ.බ/ජ.වි.පෙ බොහෝ පළාත් පාලන ආයතනවල සහ කොට්ඨාශවල බහුතරය ඔවුන් අතර දිනා ගනු ඇති බවයි. කෙසේ වෙතත්, බොහෝ පළාත් පාලන ආයතන සඳහා කිසිදු පක්ෂයක්, පූර්ණ බහුතර බලයක් දිනා ගැනීමට අපොහොසත් වන අතර හවුල් පාලනයකට යොමු වීමට සිදු වනු ඇත. ස.ජ.බ සහ ඉ.ත.අ.ක. උතුරු සහ නැගෙනහිර පළාත්වල ජා.ජ.බ/ජ.වි.පෙ ට වඩා ඉදිරියෙන් සිටියි. නමුත් බොහෝ විට ජා.ජ.බ/ජ.වි.පෙ බස්නාහිර, දකුණ, උතුරු-මැද සහ සබරගමුව පළාත්වල ග්‍රාමීය ප්‍රදේශ වලදී ස.ජ.බට වඩා ඉදිරියෙන් සිටින අතර එම පළාත් වල නාගරික සහ මහ නගර සභා සීමාවන් තුළ ස.ජ.බ ඉදිරියෙන් සිටියි.

IHP හි ප්‍රධාන විමර්ශක සහ විධායක අධ්‍යක්ෂ ආචාර්ය රන්නන්-එලිය මහතා අදහස් දක්වමින්, “2018 පළාත් පාලන මැතිවරණයට වඩා මෙහිදී විශාල වෙනසක් සිදු වනු ඇත. මෙයට ප්‍රධාන හේතු සාධකය වන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඡන්ද බිඳ වැටීම වන අතර, ජා.ජ.බ/ජ.වි.පෙ විසින් පක්ෂය හැර ගිය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ඡන්දදායකයින් දිනා ගැනීමට සහ ඔවුන්ගේ 2020 මහ මැතිවරණයේ ඡන්දදායකයින් රඳවා ගැනීමට ස.ජ.බ ට වඩා හොඳින් ක්‍රියා කර තිබීමයි.”

## 2020 දී ශ්‍රී.ල.පො.පෙ ඡන්දදායකයින්ගෙන් හතෙන් එකකට වඩා අඩු ප්‍රමාණයක් අද එම පක්ෂයට ඡන්දය ලබා දීමට අදහස් කරයි. තිදෙනෙකුගෙන් එක් අයෙක් ජා.ජ.බ/ජ.වි.පෙ වෙත ද, පස් දෙනෙකුගෙන් එක් අයෙකු ස.ජ.බ වෙත ද මාරු වී ඇත

අද මහ මැතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කුමන පක්ෂයටද?




ශ්‍රී ලංකා සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, මත විමසුම් සමීක්ෂණය MRP

2021 අගෝස්තු 31 සිට 2023 පෙබරවාරි 16 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 9,710 මත මාසික ඇස්තමේන්තු පදනම් වේ. මාසය සහ පක්ෂය අනුව ජාතික ජනගහනය සමඟ ගැළපීමට 2-5%ක දෝෂ ආන්තිකයක් සමඟ IHP හි MRP G ආකෘතිය භාවිතයෙන් ඇස්තමේන්තු කර ඇත.

මුළු ලියාපදිංචි ඡන්දදායකයින් සැලකූ විට, ස.ජ.බ ට වඩා ජා.ජ.බ/ජ.වි.පෙ පැහැදිලි ලෙසම ඉදිරියෙන් සිටින නමුත් ස.ජ.බ පාර්ශවකරුවන් ඡන්දය ප්‍රකාශ කිරීමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් ඇති බැවින් දෙපාර්ශවය අතර පරතරය 2% කින් අඩු වීමට ඉඩ ඇත.

### සම්පූර්ණ වාර්තා ihp.lk වෙතින් ලබා ගත හැකිය

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 පෙබරවාරි, "ජා.ජ.බ/ජ.වි.පෙ සහ ස.ජ.බ ඡන්දදායකයින් අතර කරට කර සටනක් : 2023 ජනවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු", SLOTS වාර්තාව #2023-03. http://ihp.lk/publications/docs/SLOTSReport202303.pdf යෙන් ලබා ගත හැකිය.

### සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

### ක්‍රමවේදය

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 ජනවාරි MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 724ක් සහ 2021 අගෝස්තු 31 සිට 2023 පෙබරවාරි 16 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 9,710ක් මත පදනම් වන අතර ප්‍රධාන පක්ෂයන් සඳහා 2-3%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත.

MRP යනු විශ්ලේෂණයට කුඩා සාම්පල භාවිත කිරීම සඳහා වෙනත් රටවල ඡන්ද ආයතන විසින් සුලබව භාවිත කරනු ලබන ක්‍රමයකි, විශේෂයෙන් YouGov විසින් එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් ජනමත විචාරණයේ

සහ මෑත කාලීන එක්සත් රාජධානියේ මහ මැතිවරණයේ ප්‍රතිඵල පුරෝකථනය කිරීමට මෙම ක්‍රමය භාවිතා කළේය. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.